# විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල - 2012

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.2.1 **ලැබිය යුතු ගිණුම්**

2012 අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා විශ්වවිද්‍යාලවලින් විස්තර ගෙන්වාගෙන විශ්‍රාම වැටුප් අරමුදලට සේවක අර්ථසාධක අරමුදලින් ලැබිය යුතු ජීවන වියදම් දීමනාවට අදාල වූ රු.32,137,660 ක් අයකර ගෙන නොතිබුණි.

1.2.2 **නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| **නීති,රීති හා රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) 1999 අප්‍රේල් 09 දිනැති හා අංක අමප/99/0438/11/033 දරන අමාත්‍ය මණ්ඩල තීරණය | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව නිලධාරීන් වෙනුවෙන් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට බැර කරනු ලබන සියයට 25 ක මුදලින් සියයට 10 ක් විශ්‍රාම වැටුප් අරමුදලට බැර කළ යුතුවේ. එහෙත් 1999 ජුනි 10 දිනැති අංක 747 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව සේව්‍යයා විසින් අර්ථසාධක අරමුදලට බැර කරනු ලබන සියයට 15 ක දායක මුදලින් 8/15 ක ප්‍රමාණයක් විශ්‍රාම වැටුප් අරමුදලට බැර කිරීමට කටයුතු කර තිබුණි. 2011 වර්ෂයේ විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් 2013 මාර්තු 07 දින පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී ද මෙම ගැටළුව විසදා ගැනීමට කටයුතු කරන ලෙස නියෝග කළද, ඒ |

අනුව කටයුතු කර නොතිබුණි.

| | |
|---|---|
| (ආ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 97 වගන්තිය. | 2012 වර්ෂයේදී විශ්‍රාම වැටුප් අරමුදලේ පිළිවෙලින් රු.207,724,261 ක හා රු.197,135,825 ක ආදායම් හා වියදම් ගිණුම්ගත කර තිබුණද, අරමුදල විධිමත් කිරීම, පරිපාලනය කිරීම සහ එහි කළමනාකාරිත්වය සඳහා කොමිෂන් සභාව විසින් නියමාවලි සකස් කර නොතිබුණි. |
| (ඇ) 2005 ජනවාරි 28 දිනැති අංක පා / ආයතන / 2004 දරන කම්කරු කොමසාරිස් ජනරාල්ගේ ලිපිය | 2011 මාර්තු 23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය සංශෝධනය කිරීමට කටයුතු කිරීමකින් තොරව භාණ්ඩාගාර එකඟත්වය මත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අධ්‍යයන දීමනාව, මුළු ඉපයීම් යන නිර්වචනය තුළට ඇතුළත් කර 2013 ජනවාරි 08 දින අංක 1000 දරන චක්‍රලේඛය නිකුත් කර තිබුණි. යථෝක්ත චක්‍රලේඛය නිකුත් කිරීමට පෙර අධ්‍යයන දීමනාව ඇතුළත් කිරීම හේතුවෙන් විශ්‍රාම වැටුප් අරමුදලට වැඩිපුර ලැබුණු රුපියල් මිලියන 248.57 පියවීමට හෝ විධිමත් ක්‍රියාමාර්ගයක් ගැනීමට 2012 දෙසැම්බර් 31 දින දක්වා කටයුතු කර නොතිබුණි. |
| (ඈ) 1999 ජුනි 10 දිනැති අංක 747 දරන විශ්වවිද්‍යාල කොමිෂන් සභා චක්‍රලේඛය. | විශ්‍රාම වැටුප් ක්‍රමය සෑම අවුරුදු 3 කට වරක්ම ඇගයීමකට ලක් කර නව සාමාජිකයන්ගේ දායකවීම් / ප්‍රතලාභ ගෙවීම් නිරීක්ෂණය කළයුතු වුවද, එම ඇගයීම් 2008 දෙසැම්බර් 31 දිනෙන් පසුව සිදුකර නොතිබුණි. |

2.

<u>මූල්‍ය සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ රු.10,588,436 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා අතිරික්තය රු.61,151,399 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.50,562,963 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ආයෝජන ආදායම රු.3,744,687 කින් වැඩිවී තිබියදී සාමාජික හා විශ්‍රාමික ගිණුම් සඳහා පොළී ගෙවීම් පිළිවෙලින් රු.50,780,030 කින් හා රු.1,569,872 කින් වැඩිවීමද, විශ්‍රාමික අරමුදල් ගැලපීම රු.452,266 කින් වැඩිවීම යන කරුණු එම පිරිහීම කෙරෙහි විශේෂයෙන් බලපා තිබුණි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පසුගිය වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.50,562,963 කින් එනම් සියයට 83 කින් අඩු වී තිබුණි. ප්‍රධාන ආදායම් හා වියදම් විචලනයන් පහත දැක්වේ.

| | 2012 | 2011 | විචලනය | විචලනයේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | සියයට |
| ආයෝජන ආදායම | 227,837,778 | 224,093,091 | 3,744,687 | 2 |
| සාමාජික ගිණුම් සඳහා පොළී | 189,115,287 | 138,335,257 | 50,780,030 | 37 |
| විශ්‍රාම ගිණුම් සඳහා පොළී | 6,153,684 | 4,583,812 | 1,569,872 | 34 |
| විශ්‍රාමික අරමුදල් ගැලපීම | 1,755,904 | 1,303,638 | 452,266 | 35 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1999 සැප්තැම්බර් 01 දින පිහිටවූ විශ්‍රාම වැටුප් අරමුදලේ සමාලෝචිත වර්ෂය අවසාන වන විට විශ්‍රාම වැටුප් ලබන විශ්‍රාමිකයන්ගේ සංඛ්‍යාව 121 ක් වූ අතර ඔවුන් සඳහා සමාලෝචිත වර්ෂයේ ගෙවා තිබූ විශ්‍රාම වැටුප් මුදල රු.17,495,086 ක් විය. සමාලෝචිත වර්ෂය අවසානයේදී විශ්‍රාමිකයන්ගේ අරමුදලේ බැරට තිබුණු ශේෂය රු.78,674,647 ක් වූ අතර එම ශේෂයෙන් ඉදිරි කාලයට විශ්‍රාම වැටුප් ගෙවිය හැකි වනුයේ ඉදිරි වර්ෂවල පැවතිය හැකි වගකීම් නොසලකා දළ වශයෙන් වර්ෂ 4 1/2 ක කාලයක් සඳහා පමණක් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ විශ්‍රාමිකයින්ගේ පෞද්ගලික ගිණුම්වල ශේෂයක් නොතිබියදී එකතුව රු.1,755,904 ක මුදලක් සාමාජිකයන් 15 දෙනෙකුට විශ්‍රාම වැටුප් ලෙස ගෙවා තිබුණි. 2008 වර්ෂය හා සලකා බැලීමේදී ගිණුම්වල පෞද්ගලික ශේෂ නොතිබියදී විශ්‍රාම වැටුප් ගෙවූ සේවක සංඛ්‍යාව සියයට 400 කින් වැඩි වී තිබුණු අතර ඒ සඳහා සිදුකළ වියදමද 2008 වර්ෂය හා සලකා බැලීමේදී සියයට 1,105 කින් වර්ධනය වී තිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

1999 ජූනි 10 දිනැති අංක 747 දරන කොමිෂන් සභා චක්‍රලේඛය මගින් විශ්වවිද්‍යාල සඳහා පිහිටුවා තිබූ විශ්‍රාම වැටුප් අරමුදලේ වියදම් ලෙස පොළී, විගණන ගාස්තු හා බැංකු ගාස්තු පමණක් ගිණුම් ගත කර තිබුණු අතර අනෙකුත් පරිපාලන හා වෙනත් වියදම් විශ්‍රාම වැටුප් අරමුදල යටතේ ගිණුම් ගත කර නොතිබුණි.

## 4. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අරමුදලේ සභාපතිවරයා වෙත වරින් වර දන්වන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ විශේෂ අවධානය යොමුකල යුතුය.

(අ) විශ්‍රාම වැටුප් ගෙවීම

(ආ) විශ්‍රාම වැටුප් ක්‍රමය ඇගයීම